# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1918/17 - 2015 ජුනි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2015.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක. 58.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1) (අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, සියළු පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතන විසින්, සිය ආයතන වෙතින් අභ්‍යන්තර ප්‍රතිකාර ලබාගන්නා සියළු රෝගීන් වෙත නිකුත් කරනු ලබන ලදුපත්/බිල්පත් වල පහත තොරතුරු / විස්තර අන්තර්ගත විය යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

* රෝගියා වෙත ලබාදුන් ඖෂධ හා විටමින් වර්ගවල එක් ඖෂධයේ / විටමිනයේ වර්ගීය (Generic) නාමය/සන්නම් නාමය, භාවිතා කළ ප්‍රමාණය, සම්පූර්ණ පිරිවැය අඩංගු විස්තර.

* රෝගියාට ප්‍රතිකාර කිරීමට භාවිතා කළ සියළු වෛද්‍ය උපකරණ හා ඒවා භාවිතා කළ ප්‍රමාණය හා භාවිතා කළ එක් එක් වෛද්‍ය උපකරණය සඳහා පිරිවැය අඩංගු විස්තර.

මෙම විධානය වර්ෂ 2015 ජූලි මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2015 ජුනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

06 - 758

1A - PG 2502 — 206 (2015/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.